# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 01 දරන කේ. ජයතිලක පදනම
## (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 ජනවාරි මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 ජනවාරි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2007 අංක 01 දරන කේ. ජයතිලක පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජනවාරි මස 16 වන දින]

එල්. ඩී. ඕ.—අයි. එන්. සී. 21/2005

කේ. ජයතිලක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"කේ. ජයතිලක පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක් එහි සාමාජිකයන් එකඟ වන ලද රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියළු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එම පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින්ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 01 දරන කේ. ජයතිලක පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හා ඉන් පසු, (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) කේ. ජයතිලක පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කේ ජයතිලක පදනම" යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. කේ. ජයතිලක පදනම සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ මෙහි පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) භාෂාව සහ සාහිත්‍ය අභිවෘද්ධිය සඳහා පියවර හඳුන්වා දීම ;

(ආ) කේ. ජයතිලකයන්ගේ නිර්මාණ හා ශාස්ත්‍රීය කෘති සංරක්ෂණය කිරීම, පළ කිරීම සහ අනාගත පරපුරට උරුම කිරීම ;

(ඇ) කේ. ජයතිලකයන් උපන් ගම කේන්ද්‍ර කොට ගෙන නිර්මාණාත්මක සහ සම්ප්‍රදායික සහ ශාස්ත්‍රීය කාර්ය සඳහා ආශ්‍රමයක් පිහිටුවීම හා සාහිත්‍ය සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වාගෙන යාම ;

(ඈ) නව නිර්මාණාත්මක හා සම්භාව්‍ය සාහිත්‍යයක් බිහි කිරීමේ යෙදී සිටින්නන් දිරි ගැන්වීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ;

(ඉ) කේ. ජයතිලකයන්ගේ උපන් ගමෙහි හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ ජනතාවගේ කලා හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් පියවර ගැනීම ;

(ඊ) මෙම කාර්යයන් දිවයිනේ වෙනත් ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීම ;

(උ) සංස්ථාව විසින් අනුමත කරන ආගමික, සංස්කෘතික හා සමාජ සේවාවන්ට අනුග්‍රහ දැක්වීම ;

(ඌ) අවශය යයි සංස්ථාව විසින් සලකනු ලබන සමාජ සේවා ආයතන සහ ආගමික හා සංස්කෘතිකමය සංවිධාන සමග සබඳතා ඇතිකර ගනිමින් සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුලුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට, එම රීතිවල විධිවිධාන සලස්වා ඇති නිලධරයන් සහ වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ ද, ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන්නා වූ ද, කළමනාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති පදනමේ කළමනාකරණ මණ්ඩලයේ ධුර දැරූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සම්බන්ධයෙන් ද, කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් ද, කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් ද, සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සංස්ථාවේ කටයුතු කරගෙන යාම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී, එවැනි ම ආකාරයෙන් එම රීති වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එම රීති සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සියලුම සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ විට, සංස්ථාව විසින් කලින් කලට සාදනු ලබන රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7**. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, මේ යටතේ හෝ මින් මතු සංස්ථාව සඳහා හෝ සංස්ථාව වෙනුවෙන් පිළිගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

**8**. (1) සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ අදහස් වේ.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**9**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංසථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ද පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11**. සංස්ථාවේ රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි වූ නිලධරයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ ස්වකීය නම් අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මඟින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේදැයි සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.